දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් වාර්තා කිරීමේදී ප්‍රවේසම් වන ලෙසත්, මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල වන ලෙසත් අපි නිතරම සිහි කැඳවමු. ඊට හේතුව, දිවි තොර කරගැනීම්ද වසංගතයක් ලෙසින් පැතිර යෑමට හැකියාවක් ඇති බව පර්යේෂණ මගින් පෙන්වා දී තිබීමයි. එහිදී, දිවි තොර කරගැනීම් පිළිබඳ පුවත් සමගින් හදිසි උපකාරක අංක සඳහන් කිරීමද අවශ්‍යතාවයකි. ඒ ඔස්සේ, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවක් ඇති අයෙකු හදිසි උපකාරක අංක ඔස්සේ උපදේශන සහාය ලබාගැනීමට නැඹුරු විය හැකි බැවිනි. එයින් තවත් දිවි තොර කරගැනීමකින් නැතිව යෑමට තිබූ එක් ජීවිතයක් හෝ බේරාගැනීමට ඉඩ සැලසෙනු ඇත.

ආචාර ධර්මානුකූල දිවි තොර කරගැනීම් වාර්තා කිරීම සම්බන්ධයෙන් කතා කිරීමේදී, ඇමරිකාවේ වොෂිංටන් නුවර හමුදා භටයෙකු දිවි තොර කරගැනීමේ සිදුවීමක් දෙස් සහ විදෙස් මාධ්‍ය වාර්තා කර තිබූ අයුරු නිරීක්ෂණය කිරීම වටී.

සිදුවීම වාර්තා කරනා දිවයින පුවත්පත සමග හදිසි උපකාරක අංක පළ වී නැත.

සිදුවීම වාර්තා කරනා මියාමි හැරල්ඩ් පුවත් සේවාව The national suicide prevention lifeline හි උපකාරක අංක ඉදිරිපත් කර ඇත.

මේ අනුව, ඔබ තෝරාගන්නේ කුමන පුවත් වාර්තාවද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)